## කර්මාන්ත[1]

1980 වර්ෂයේදී නිෂ්පාදිත කර්මාන්තවල කැපී පෙනෙන ලක්ෂණ වූයේ ආනයන මෙහෙයවුම් කර්මාන්තයන්හි ප්‍රසාරණයත්, කර්මාන්ත සඳහා පුළුල් විදේශ සහභාගීත්වයත්, කාර්යක්ෂමතාවයෙන් ඌන කර්මාන්තයන්ට ආනයන භාණ්ඩ සමඟ තරඟකාරීත්වයට මුහුණ දීමට සිදුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දුර්වල ආයතනයන් වසා දැමීමට ඇතැම් අවස්ථාවලදී සිදුවීමත් ය.

1977 ආර්ථික ප්‍රතිසංස්කරණවලට පෙර, දැඩි ආනයන පාලන, විදේශ විනිමය වෙන් කිරීම් හා ඉහළ තීරු බදු මගින් කර්මාන්ත විශාල වශයෙන් ආරක්ෂා වී තිබුණි. යෝජනා ක්‍රම සඳහා ලැබුණ විදේශ ආධාර මගින්ද ඇතැම් කර්මාන්ත සඳහා වාසි සහගත ආවරණීත වර්ධන-යකට අවශ්‍ය පසුබිම් සැලසිණ. දිගු කාලයක් තිස්සේ අඛන්ඩව පැවති මෙම සීමා කිරීම් මගින් බොහෝ දුරට දිරි ගන්වනු ලැබුවේ දේශීය වෙළෙඳපලට නැඹුරු වූ කාර්මික අංශයකි. මෙම පියවර බොහෝ අවස්ථාවලදී අකාර්යක්ෂම කර්මාන්තයන්ට ආධාරකාරී වූ අතර, එමගින් විදේශ ආයෝජනයන් ගලා ඒම හා කර්මාන්ත අංශයේ විශාල පරිමාණ ආයෝජනයන් අධෛර්යමත් කරනු ලැබිණ. ආරක්ෂක තීරු බදු ක්‍රමයක් තුළ රැඳී සිටිමින්, වෙළෙඳ බාධක ඉවත් කිරීමත් සමගම ඇතැම් ව්‍යවසායකයින්, විශේෂයෙන්ම ප්‍රධාන නිෂ්පාදකයින් 1977 ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට අනතුරුව එළඹුණු කාලපරිච්ඡේදයේදී සිය ධාරිතා උපයෝගී-කරණය ඉහළ මට්ටමක පවත්වාගෙන යන අතරම භාණ්ඩවල තත්ත්වය උසස් කිරීම මගින් ආනයන භාණ්ඩයන්ගෙන් එල්ල වූ අභියෝග ඉදිරියේ සිය තරඟකාරී ශක්තිය වැඩි දියුණු කිරීමට පියවර ගනු ලැබිණ. ආයෝජන සඳහා වඩා යහපත් වූ වාතාවරණයද ආයෝජන ක්‍රියාකාරිත්වය තවදුරටත් තාර්කික ලෙස සිදු වීමට හේතු විය. මෙම කර්මාන්ත ව්‍යාපෘත වැඩ පිළිවෙල බොහොමයක් සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය, තාක්ෂණික දැනුම හා කළමනාකාරිත්ව දැනුම ලබා දීම මගින් විදේශීය සහභාගී කරුවන්ගේ සහාය ලැබිණ.

1980 දී මුළු කාර්මික නිෂ්පාදනය මූර්ත වශයෙන් සියයට 6 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. 1979 වර්ෂය නිදහස් ආර්ථික ප්‍රතිපත්තිවලට පිවිසීමෙන් අනතුරුව ඇති වූ ප්‍රතිඵල ඒකාබද්ධ කොට ගත් වර්ෂයක් ලෙස සැලකිය හැකි අතර, 1980 වර්ෂය ඒවා තවත් ඉදිරියට ගෙනගිය වර්ෂයක් ලෙස හුවා දැක්විය හැකිය. වර්ෂය තුළ කාර්මික වර්ධනයට හේතු වූ ඉතාමත්ම වැදගත් කරුණ වී ඇත්තේ ඛනිජ තෙල් නිෂ්පාදනයන් සියයට 31 කින් වැඩි වීමයි. කාර්මික අංශයේ වර්ධනයට, සකස් කළ ඇඳුම් පැළඳුම්, දැව නිෂ්පාදිත, මූලික ලෝහ වර්ග, චීනමැටි හා රබර් නිෂ්පාදිතයන්ගේ වැඩි වීමද ඉවහල් වී තිබේ.

අනෙක් අතට, ආනයන භාණ්ඩ නිදහසේ ගලා ඒම නිසා ඇතැම් කර්මාන්ත දැඩි පීඩනයට ගොදුරු විය. නිෂ්පාදනයේ පසුබෑම රෙදිපිළි කර්මාන්තයෙහි කැපී පෙනෙන්නට විය. රජයට අයත් රෙදිපිළි කම්හල්වල මෙන්ම පෞද්ගලික අංශයේ රෙදිපිළි කම්හල්වලද නූල් හා රෙදිපිළි නිෂ්පාදනය, අලෙවිකරණය පිළිබඳ ගැටළු හේතුකොටගෙන වර්ෂය තුළදී විශාල වශයෙන් අඩු කරනු ලැබිණ. උසස් වර්ගයේ රෙදිපිළි සඳහා ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් උසුලන රට වලින් විවිධ මෝස්තර වලින් යුත් රෙදිපිළි ආනයනය කරනු ලැබිණ. මෙහිදී ඉස්මතු කර දැක්විය හැකි කරුණක් වන්නේ ආනයනය කරනු ලැබූ මෙම රෙදිපිළි වලින් බොහොමයක් එයාර් ජෙට ලූම්ස්, වෝටර් ජෙට් ලූම්ස් හා රැපියර් ලූම්ස් බඳු ස්වයංක්‍රිය යන්ත්‍ර උපයෝගී කර ගනිමින් ඉතාමත් කාර්යක්ෂම තත්ත්වයන් යටතේ නිෂ්පාදනය කරනු ලැබූ ඒවා

---

1. පසුගිය වර්ෂවලදී මෙන් 1980 වර්ෂය සඳහාද කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වයට අදාළ දත්තයන් පුද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ සියළුම වාර්තාගත හා ප්‍රසිද්ධ නිෂ්පාදන කර්මාන්තයන්ට – විශාල, මධ්‍යම හා කුඩා – ආමන්ත්‍රිත ප්‍රශ්නාවලින්ට පිළිතුරු වශයෙන් ලැබුණු තොරතුරු මත පදනම් විය. පොදුවේ ගත් කල ආමන්ත්‍රිත ආයතනයන්ගෙන් තුනෙන් පංගුවකින් පමණ පිළිතුරු ලැබුණු අතර, ඒවායින් ප්‍රධාන කර්මාන්තයන් සියල්ලක්ම පාහේ නියෝජනය විය. දත්තයන් ලබා ගත නොහැකි වූ අංශයන් පිළිබඳව විවිධ රාජ්‍ය ආයතනයන් හා සංවිධානයන්ගෙන් ලබා ගත හැකි වූ තොරතුරු පදනම් කොට කෙරුණු ඇස්තමේන්තු ප්‍රයෝජනයට ගනු ලැබිණි.

වීමයි. සංසන්දනාත්මක ලෙස බලනවිට ඉතාමත් පැහැදිලි වෙනසක් ලෙස දැක්විය හැක්කේ මෙරටේ බොහොමයක් රෙදිපිළි කම්හල් පහත් නිෂ්පාදනයෙන් හා සීමිත හැකියාවන්ගෙන් යුත් යල් පැන ගිය යන්ත්‍ර භාවිතා කරනු ලැබීමයි. යල් පැනගිය සහ පටු හැකියාවකින් යුත් මෙම යන්ත්‍ර මගින් නිපදවිය හැක්කේ වර්ග කිහිපයකට පමණක් සීමා වූ රෙදිපිළි වන අතර එවැනි බාල රෙදිපිළි සඳහා අධික නිෂ්පාදන පිරිවැයක් දැරීමට සිදු විය. තවද, රෙදිපිළි සඳහා සාපේක්ෂ වශයෙන් ඉහළ මිලක් පවතිද්දීත් තත්ත්වයෙන් ඉහළ රෙදිපිළි සඳහා වූ පාරිභෝගික රුචිකත්වය හේතුකොටගෙන ආනයනය කරනු ලැබූ රෙදිපිළි අලෙවි කිරීමට වෙළෙඳුන්ට හැකි වී තිබේ. මෙ හැරුණු විට, මෙරටට පැමිණෙන්නවුන් සඳහා වූ නිදහස් ගමන් බඩු දීමනාවත්, වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පැවති තෑගි පාර්සල් ක්‍රමයත් බඳු පහසුකම් අනිසි ලෙස යොදා ගැනීමෙන්ද ආනයනය කරනු ලැබූ රෙදිපිළි අලෙවිකරණය සඳහා ධෛර්යයක් ලැබිණ. මෙ කරුණු අනුව බලන විට, රෙදිපිළිවල තත්ත්වය හා මිළ මට්ටම යන කරුණු දෙකින්ම ආනයනය කරනු ලැබූ රෙදිපිළි හා සාර්ථක ලෙස තරඟ කිරීමට දේශීය රෙදිපිළි නිෂ්පාදකයාට නොහැකි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ රෙදිපිළි නිෂ්පාදන ආයතන බොහොමයක් සැළකිය යුතු ප්‍රමාණයක ද්‍රවශීලතා ගැටළුවලට මුහුණපානු ලැබිණ. අවසානයේදී මෙම ගැටළු විසඳීම සඳහා රජය මැදිහත් වූ අතර ජාතික පේෂ කර්මාන්ත සංස්ථාවට අයත් රෙදිපිළි කම්හල් පහ මනා පාලනයක් සහ මෙම කර්මාන්ත මුහුණ පා ඇති ව්‍යුහාත්මක හා තාක්ෂණික ගැටළු පිළිබඳව වඩාත් කිට්ටුවෙන් සොයා බැලීම සඳහා විදේශ රෙදිපිළි නිෂ්පාදන ආයතනයන්ට පවරා දෙන ලදී. මෙලෙසම, විමධ්‍යගත බලවේග යන්ත්‍ර කම්හල් කිහිපයක්, එනම් සංඛ්‍යාවෙන් පහක්, මෙම අංශය නැවත පන ගැන්වීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ පියවර ගැනීම පිණිස 1980 වකවානුව තුළදී දේශීය පෞද්ගලික අංශයට පවරනු ලැබීය.

තරඟකාරී මිළකට ලබා ගත හැකි ආදේශක භාණ්ඩ ආනයනය කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස තවත් කර්මාන්ත ව්‍යවසායකයන් රැසකටම අලෙවිකරණය පිළිබඳ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු විය. වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ වැදගත් ප්‍රතිපත්ති තීරණයක් වූයේ පාරිභෝගික ශුභසිද්ධිය ආරක්ෂා කර ගන්නා අතරම, දේශීය කර්මාන්තයන්ට අවශ්‍ය රැක-වරණය ලබා දීම සඳහා තීරු බදු ව්‍යුහය තර්කානුකූල ලෙස සකසනු පිණිස තීරු බදු පිළිබඳ ජනාධිපති කොමිසමක් පිහිටුවනු ලැබීමයි. පොදුවේ ගත් විට වර්තමාන තීරු බදු ව්‍යුහය යටතේ අමු ද්‍රව්‍ය යෙදවුම්වලට වඩා නිමි භාණ්ඩයන් ඉහළ තීරු බද්දකට යටත් වේ. දේශීය වශයෙන් එකතු කළ අගය වැඩි කිරීම මෙම ප්‍රතිපත්තියේ අභිප්‍රාය වේ. කෙසේ වෙතත්, ඇතැම් නිෂ්පාදන සම්බන්ධයෙන් තීරු බදු විෂමතා දක්නට ලැබේ. නිදසුනක් ලෙස ඇතැම් ඖෂධ නිෂ්පාදනයන් අඩු තීරු බද්දක් යටතේ ආනයනය කිරීමට ඉඩ දී ඇති අතර එම ඖෂධයන්ම නිපදවීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යයන් හා ඇසුරුම් ද්‍රව්‍යයන් වෙනුවෙන් ඉහළ ආනයන තීරු බද්දක් ගෙවිය යුතුව ඇත. එසේම ඇතැම් විදුලි උපකරණ නිමි භාණ්ඩ වශයෙන් ආනයනය කිරීම, වඩා වාසිසහගතවීම තවත් නිදසුනකි. වඩාත් යෝග්‍ය තරඟ-කාරිත්වයකට ඉඩ සලසනු පිණිස මෙබඳු විෂමතාවයන් නිවැරදි කළයුතුව ඇත. සක්‍රිය තීරු බදු ආරක්ෂණය හා බදු බර අඛණ්ඩව සොයා බැලීමේ පදනමක් මත වඩාත් අර්ථවත් තීරු බදු ප්‍රතිපත්තියක් සකස් කිරීම තීරු බදු පිළිබඳ ජනාධිපති කොමිෂමෙන් අපේක්ෂා කෙරේ.

අලෙවිකරණය පිළිබඳ දුෂ්කරතා, ප්‍රාග්ධන හිඟකම, අධික පිරිවැය හා අමු ද්‍රව්‍ය හිඟකම යන කරුණුවල ප්‍රතිඵලයක් ලෙස කුඩා පරිමාණයේ කර්මාන්ත ව්‍යවසායයන් බොහොමයක් වර්ෂය තුළදී වසා දමනු ලැබූ බව මහ බැංකුව මගින් කර්මාන්ත කරුවන් වෙත යවන ලද ප්‍රශ්නාවලීන්ට ලැබූ පිළිතුරු මගින් අනාවරණය වේ. අත් යන්ත්‍ර රෙදිපිළි, අතින් සෑදූ කඩදාසි, රසායනික ද්‍රව්‍ය, සබන්, තීන්ත වර්ග හා සකස් කළ ලෝහ භාණ්ඩ මෙම කර්මාන්ත ව්‍යවසායයන්ට ඇතුළත් වේ. එක් අතකින් මෙම කර්මාන්තයන් මුහුණ පා ඇති ගැටළු හා අනින් අතින් දේශීය අමු ද්‍රව්‍යයන් යොදා ගැනීම සහ සේවා නියුක්ති අවස්ථාවන් සැලසීම බඳු එම ව්‍යවසායයන්ගෙන් ලැබෙන වාසි ගැන සළකා බලන විට මෙම කර්මාන්ත-යන් සඳහා අවශ්‍ය සක්‍රිය තීරු බදු ආරක්ෂණය සැළකිල්ලට ගනිමින් වර්තමාන තීරු බදු ව්‍යුහය පිළිබඳ නැවත පරීක්ෂා කර බැලීමක් ඉතා ඉක්මනින් අවශ්‍ය බව පෙනේ. කෙසේ වෙතත් එක් කරුණක් අවධාරණයෙන් සඳහන් කළ යුතුව ඇත. එනම් මෙම අංශය මුහුණ පා ඇති

තත්ත්වය සහ තරඟ කළ නොහැකි කර්මාන්තයන්ට නිෂ්පාදනයෙන් ඉවත් වීමට ඉඩ දුනහොත් සේවා නියුක්තිය හා මුළු සැපයුම් කෙරෙහි ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක ගැන බොහෝවිට පෙන්වා දෙනු ලැබුවද, ඒවා තවදුරටත් පවත්වාගෙන යා යුත්තේ ආර්ථිකමය පදනමක් මත මිස සුභසාධක පදනමක් මත නොවේ. මෙම තරඟකාරී නොවන හා අකාර්යක්ෂම කර්මාන්තයන් සහනාධාර පදනමක් මත පවත්වාගෙන යාමේ පිරිවැය රජය හෝ පාරිභෝගිකයා විසින් දැරිය යුතු නොවේ. දිගුකාලීන වශයෙන් බලනවිට, මෙම කර්මාන්තයන්හි යොදා ඇති නිෂ්පාදන සාධක පිළිබඳ ප්‍රති ව්‍යාප්තියක් ඇති කිරීම පූර්ණ වශයෙන් ඵලදායී වේ.

කර්මාන්ත රාශීකරණය පිළිබඳ කරුණු සළකා බලන විට මෑත අතීතයේදී කර්මාන්ත අංශය විශාල වශයෙන් නිෂ්පාදිත අතලොස්සක් මත රැඳී පැවති බව පෙනේ. 1980 දී ලද අත්දැකීම්ද මීට වෙනස් නොවීය. 1980 දී මුළු කාර්මික නිෂ්පාදනයෙන් සියයට 45 ක් පමණ ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගෙන් සමන්විත වූ අතර මසා නිම කළ ඇඳුම් නිෂ්පාදිතයන්ගෙන් නියෝජනය වූ ප්‍රමාණය ආසන්න වශයෙන් සියයට 8 ක් විය මේ අනුව මුළු කාර්මික නිෂ්පාදනයෙන් අඩක් සමන්විත වූයේ මේ කාර්මික නිෂ්පාදිත දෙකෙනි මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු කාර්මික නිෂ්පාදනයේ උච්චාවචන මෙම කර්මාන්ත දෙකේ ආර්ථිකමය ඉරණම හා තදින් බැඳී පවතින අතර වඩාත් විවිධාංගීකරණය වූත්, වර්ධනය වූත් ආර්ථික ව්‍යුහයක් බිහි වන තාක් එය එලෙසම පවතිනු ඇත. මෙහිදී ඇඳුම් පැළඳුම් සකස් කිරීමේ කර්මාන්තය පිළිබඳව විශේෂයෙන් සළකා බැලිය යුතු වේ. සකස් කළ ඇඳුම් පැළඳුම් ආනයනය කරන රටවල් කිහිපයක්, විශේෂයෙන්ම එක්සත් ජනපදය හා යුරෝපා ආර්ථික සංගමය සලාක සීමාවන් පැනවීම හේතු කොටගෙන මෑත අතීතයේදී ලක්නට ලැබුණු එම කර්මාන්තය පිළිබඳ වේගවත් ප්‍රගතිය ආපස්සට හැරී එම කර්මාන්තය නුදුරු අනාගතයේදීම සංතෘප්ත මට්ටමකට ලඟාවීමට ඉඩ තිබේ. යුරෝපා ආර්ථික සංගමයට අයත් රටවල්. නෝර්වේ. ස්වීඩන් හා කැනඩාව මගින් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ සැකසූ ඇඳුම් පැළඳුම් සඳහා පනවන ලද සලාක සීමා 1978 සිටම ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවේ සැකසූ ඇඳුම් පැළඳුම් අපනයනයන් සඳහා ප්‍රධාන ගැනුම් කරුවා වන එක්සත් ජනපදය 1980 මැයි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සලාක සීමාවන් පනවා ඇත. එක්සත් ජනපදයේ වර්තමාන සලාක සීමාව සත් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වන අතර ශ්‍රී ලංකාවේ වර්ග හතකට අයත් සැකසූ ඇඳුම් පැළඳුම් අපනයන පරිමාවන් සඳහා විශේෂිත සීමාවන් හා අන සීමාවන් ඒ මගින් පනවා ඇත. මෙම සියළුම කරුණු වලින් ශ්‍රී ලංකා ආර්ථිකයේ පදනම විවිධාංගීකරණය කිරීමේ හදිසි අවශ්‍යතාවයක් පෙන්නුම් කරයි. කෘෂි කර්මාන්ත මත පදනම් වූ කර්මාන්ත විශාල වශයෙන් දියුණු කිරීමෙන් මෙම කාර්යය බොහෝ දුරට සපුරා ගත හැකිය. දැනට රබර් නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් අඩක් සකස් කළ ස්වරූපයෙන් අපනයනය කරනු ලබන අතර රබර් මිශ්‍රිත කොහු භාණ්ඩ, රථ වාහන සඳහා අවශ්‍ය රබර් නිෂ්පාදිත කොටස් හා රබර් වලින් තැනූ බිම් ගඩොල් වැනි භාණ්ඩ තැනීමෙන් රබර් නිෂ්පාදන කර්මාන්තය පුළුල් කිරීමේ ශක්‍යතාවයක් පවතී. ශ්‍රී ලංකාවේ දැනට අපනයනය කරනු ලබන විවිධ කෘෂිකාර්මික අමුද්‍රව්‍ය සම්බන්ධයෙන්ද මෙය අදාළ වේ. උසස් වර්ගයේ කොහු ලනු, කොහු බුමුතුරුණු කොහු බුරුසු හා කොහු පිස්නයන් ආදී කොහු නිෂ්පාදිතත්, ග්ලිසරීන්, මේද අම්ල, පොල් ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය හා පොල් ක්‍රීම් වැනි දේවලුත් නිපදවීම සඳහා පොල් ආශ්‍රිත කර්මාන්තයන් දියුණු කළ හැකිය. හාල් නිවුඩු, තල, රට කජු, සාදික්කා කුරුඳු පැහිරි වැනි සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයන්, වාෂ්පශීල තෙල් හා ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා උපයෝගී කොට ගත හැකිය.

විදේශ ආයෝජන උපදේශක කමිටුව 1980 දී රුපියල් දශ ලක්ෂ 1,792 ක ආයෝජන ශක්‍යතාවයක් සහිත කර්මාන්ත ව්‍යාපෘතීන් 86 ක් අනුමත කොට ඇති අතර මින් අපේක්ෂිත සේවා නියුක්ති ප්‍රමාණය 5,313 කි.

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය, පේෂ කර්මාන්ත අමාත්‍යාංශය සහ ධීවර අමාත්‍යාංශයට අයත් දේශීය ආයෝජන උපදේශක කමිටු මගින් වර්ෂයතුළ දී කර්මාන්ත ව්‍යාපෘතීන් 699 ක් අනුමත කොට ඇති අතර මෙම කර්මාන්ත මගින් අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 337 ක් වේ. ආසන්න වශයෙන් 15.400 කට සේවා නියුක්ති අවස්ථාවන් සැලසීමට මින් අපේක්ෂා කෙරේ 1977 ජූලි මාසයේ සිට 1980 මැයි මාසය දක්වා කාලච්ඡේදය තුළ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය යටතේ වූ දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් 2,012 න් සියයට 40 ක් නිෂ්පාදනයේ නියුක්තව සිටි අතර තවත් සියයට 28 ක් නුදුරු අනාගතයේදීම සිය නිෂ්පාදනයන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බැව් එම අමාත්‍යාංශය මගින් කරන ලද සමීක්ෂණයකින් හෙළි වී තිබේ.

කර්මාන්ත අංශයේ වූ තවත් වැදගත් පියවරක් වූයේ 1980 අවසාන භාගයේදී ප්‍රධාන කාර්මික ව්‍යවසායයන් දෙකක් සිය නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමයි. ඒවා නම්, ප්‍රිමා පිටි ඇඹරීමේ සංකීර්ණය හා යූරියා පොහොර කම්හලයි. මෙම ව්‍යවසායයන්හි නිෂ්පාදනයන් 1981 සිට සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. ත්‍රිකුණාමලයේ චීන වරායෙහි පිහිටවූ ප්‍රිමා සංකීර්ණයේ වාර්ෂික නිෂ්පාදන ධාරිතාව තිරිඟු පිටි මෙට්‍රික් ටොන් ලක්ෂ හයක් වන අතර මෙය මුළු දේශීය අවශ්‍යතාවයන් සපුරාලීමටත්, හඳිසි තොග රැස් කිරීමටත් ප්‍රමාණවත් වෙයි. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව මගින් පාලනය කරනු ලබන සපුගස්කන්දේ පිහිටි යූරියා පොහොර කම්හලෙහි පොහොර නිෂ්පාදනය 1981 දී මෙට්‍රික් ටොන් 217 000 ක්ද. 1982 සිට ඉදිරියට නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 310,000 ක්ද වෙතැයි අපේක්ෂා කෙරේ. මෙම පොහොර කම්හලට අවශ්‍ය අමු ද්‍රව්‍ය සපුගස්කන්දේ පිහිටි සිය පිරිපහදුව මගින් ඛනිජ තෙල් සංස්ථාවෙන් සැපයෙනු ඇත. දේශීය අවශ්‍යතාව පිරිමසාලීමෙන් පසු අතිරික්ත යූරියා නිෂ්පාදනයන් අපනයනය කිරීමට බලාපොරොත්තු වේ.

කාර්මික අපනයන ඉපයීම් 1979 රුපියල් දශ ලක්ෂ 3,737 (විගැහි දශ ලක්ෂ 186) සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 5,496 (විගැහි දශ ලක්ෂ 255) දක්වා සියයට 47 කින් (විගැහි අනුව සියයට 37 කින්) වැඩි විය. අපනයන ඉපයීම් වල වැඩි වීම මසා නිම කළ ඇඳුම් හා ඛණිජ තෙල් නිෂ්පාදන අපනයන නිසා සිදු විය.

**නිෂ්පාදනය**

1980 වර්ෂය තුළ මුළු කාර්මික නිෂ්පාදනයෙහි සිදු වූ මූර්ත වර්ධනය සියයට 6 ක් වී යයි ඇස්තමේන්තු කොට ඇත. ඛනිජ තෙල් නිෂ්පාදනයෙහි සිදු වූ වේගවත් වර්ධනය ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. මූර්ත නිෂ්පාදන වටිනාකම අනුව, දැව නිෂ්පාදන සියයට 56 කින් ද, ඛනිජ තෙල් සහ රසායන ද්‍රව්‍ය සියයට 22 කින් ද මූලික ලෝහ නිෂ්පාදන සියයට 12 කින් ද, රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් සියයට 5 කින් ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 2 කින් ද වැඩි විය. අනෙක් අතින් කඩදාසි හා කඩදාසි නිෂ්පාදන සියයට 17 කින් ද, සකස් කළ ලෝහ නිෂ්පාදන සියයට 16 කින් ද, ආහාර හා බීම වර්ග සියයට 6 කින් ද අඩු විය.

**1 · 14 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන වටිනාකම 1976 – 1980**

රුපියල් දශ ලක්ෂ
(වාර්තා කළ නිෂ්පාදන ආයතන සංඛ්‍යාව වරහන් තුළ)(අ)

| කාර්මික ගණය | 1976 | 1977 | 1978 | 1979 | 1980 (ආ) |
|---|---|---|---|---|---|
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ .. | 1,715 (158) | 2,295 (162) | 2,609 (136) | 2,856 (158) | 3,899 (165) |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 680 (602) | 698 (665) | 1,008 (654) | 1,128 (589) | 1,879 (529) |
| 3· දැව හා දැව නිෂ්පාදිත (ගෘහභාණ්ඩ ඇතුළුව) .. | 129 (17) | 127 (15) | 124 (23) | 166 (28) | 247 (31) |
| 4· කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 203 (58) | 270 (64) | 376 (65) | 445 (65) | 476 (63) |
| 5· රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 2,336 (220) | 2,469 (233) | 3,279 (215) | 4,508 (193) | 8,603 (216) |
| 6· ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. .. | 360 (72) | 411 (58) | 592 (57) | 710 (67) | 914 (65) |
| 7· මූලික ලෝහ නිෂ්පාදිත .. .. | 138 (1) | 132 (1) | 219 (1) | 349 (1) | 478 (1) |
| 8· සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. .. | 474 (358) | 571 (285) | 590 (296) | 569 (301) | 620 (268) |
| 9· අනිකුත් .. .. | 26 (22) | 34 (27) | 55 (26) | 50 (33) | 54 (28) |
| එකතුව | 6,061 (1,508) | 7,007 (1,510) | 8,852 (1,473) | 10,781 (1,435) | 17,170 (1,366) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

අ ) මහ බැංකුව විසින් යවන ලද ප්‍රශ්න මාලාවට පිළිතුරු සපයන ලද නිෂ්පාදන ආයතන සංඛ්‍යාව.
(ආ) තාවකාලිකයි.

වර්තන වටිනාකම් අනුව, 1·14 සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි, සමස්ත කාර්මික නිෂ්පාදනය 1980 වර්ෂයේදී සියයට 59 කින් වර්ධනය විය. මෙයට බොහෝ දුරට හේතු වූයේ ඛනිජ තෙල් අංශයෙහි නිෂ්පාදන වටිනාකම දෙගුණයකින් පමණ ඉහළ යාමයි. ඛනිජ තෙල් නිෂ්පාදනයන් අත්හල විට, සෙසු කාර්මික නිෂ්පාදනයන්ගේ වර්තන වටිනාකම වර්ධනය වී ඇත්තේ සියයට 33 කින් පමණි. 1980 වර්ෂය තුළ රසායන ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් නිෂ්පාදන වටිනාකම සියයට 91 කින් ද, දැව හා දැව නිෂ්පාදන වටිනාකම සියයට 49 කින්ද, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන වටිනාකම සියයට 67 කින් ද, මූලික ලෝහ නිෂ්පාදන වටිනාකම සියයට 37 කින් ද, ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන වටිනාකම සියයට 37 කින් ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන වටිනාකම සියයට 29 කින් ද, සකස් කළ ලෝහ නිෂ්පාදන වටිනාකම සියයට 9 කින්ද, කඩදසි නිෂ්පාදන වටිනාකම සියයට 7 කින් ද වැඩි විය.

රසායන ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් නිෂ්පාදන අංශයෙහි සිදු වී ඇති විශාල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ තෙල් පිරිපහදු නිෂ්පාදන ඉහළ යාමයි. මාස කීපයක් තිස්සේ නොකඩවා තෙල් පිරිපහදු කටයුතු නවතා දමා තිබීමත්, බොර තෙල් සපයා ගැනීමේ දුෂ්කරතා පැවතීමත් හේතුවෙන් 1979 වර්ෂය තුළ ඛනිජ තෙල් නිෂ්පාදනය පහළ මට්ටමක පැවතුනි. පිරිපහදු ක්‍රමයේ සිදු කරන ලද ශිල්පීය නවීකරණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස 1980 දී පිරිපහදු කටයුතු සඳහා වැඩි බොර තෙල් ප්‍රමාණයක් යොද ගැනීමට හැකියාව ලැබිණි. තෙල් පිරිපහදු කර්මාන්තයේ ආසවන ඒකකයෙහි යම් යම් දියුණු කිරීම් තුළින් ප්‍රාථමික ආසවන ධාරිතාවය මෙම වර්ෂය තුළ සියයට 31 කින් ඉහළ නැංවීමට හැකි වීය.

## බලය හා ඉන්ධන

ගත වූ වර්ෂයේ කාර්මික නිෂ්පාදිතයේ වර්ධනය, අපනයන සැකසුම් කර්මාන්ත ඇතුළු කර්මාන්ත සඳහා දේශිය කාර්මික ඉන්ධන විකුණුම් සියයට 3 කින් ඉහළයාම මඟින් පෙන්නුම කරයි.

**1 · 15 සංඛ්‍යා සටහන**

**කර්මාන්තවල බල හා ඉන්ධන පාවිච්චිය 1978—1980**

| ශීර්ෂ | 1978 | 1979 | 1980(අ) |
|---|---|---|---|
| 1· කර්මාන්ත අංශයේ විදුලිය බල පරිභෝජනය (ආ) (ගිග වෝල්ට් පැය) .. | **587.9** | **633.4** | **618.1** |
| 1·1 කුඩා පරිමාණ කර්මාන්ත .. | 10·6 | 16·7 | 24·0 |
| 1·2 මධ්‍ය පරිමාණ කර්මාන්ත .. | 278·2 | 287·3 | 285·5 |
| 1·3 මහා පරිමාණ කර්මාන්ත .. | 299·1 | 329·4 | 308·6 |
| 2· කාර්මික ඉන්ධනවල දේශීය විකුණුම් (මෙට්‍රික් ටොන් දහස් ගණනින්) .. | **220.4** | **226.1** | **295.4** |
| 2·1 බැර ඩීසල් .. | 60·8 | 64·0 | 60·8 |
| 2·2 දැවි තෙල් .. | 159·6 | 162·1 | 234·6 |

මූලය: ලංකා විදුලි බල මණ්ඩලය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) තාවකාලික.

(ආ) කාර්මික නිෂ්පාදන සහ අපනයන සැකසුම් කර්මාන්ත ද ඇතුලත්ය. කුඩා පරිමාණ කර්මාන්ත යනු කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවක් ඇති කර්මාන්ත වන අතර, කිලෝවොට් ඇම්පියර් 50 – 100 අතර ඒවා මධ්‍ය පරිමාණ කර්මාන්ත වශයෙන් ද, කිලෝවොට් ඇම්පියර් 500 ට වැඩි ඒවා මහා පරිමාණ කර්මාන්ත වශයෙන්ද සැලකේ.

විදුලිය සීමා කිරීම හේතුකොටගෙන, කර්මාන්තවල විදුලි බල පරිභෝජනය සියයට 2 කින් පහත වැටින. වර්ෂයේ දෙවැනි කාර්තුව තුළ, ප්‍රධාන ජලාශයන්ගේ ජල මට්ටම අඩු වීමේ හේතුවෙන් විදුලි බල සැපයුම නිශ්චිත පැය ගණනක් තුළ කපා හැරින. කෙසේ වුව ද, ප්‍රධාන කර්මාන්ත අතිරේක විදුලි බල උත්පාදක යන්ත්‍ර භාවිතා කිරීම සහ විදුලි බලය සීමා නොකළ කාලසීමාවන්ට වැඩ මුර මාරු කිරීම හේතුකොටගෙන විදුලි බලය සීමා කිරීමෙන් කර්මාන්ත කෙරේ ඇති වූ බලපෑම ඉතා සුළු වූ බව පෙනේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් කිහිපයක් ඔවුන්ගේම විදුලි බල උත්පාදක යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීම නිසා ඔවුනට විදුලිබලය සීමා කිරීමෙන් බලපෑමක් නොවීය. පෞද්ගලික අංශයේ සමහර කර්මාන්ත තමන්ගේම විදුලි බල උත්පාදක යන්ත්‍ර යොදා ගැනීමෙන් ද, තවත් සමහර ව්‍යවසායයන් සේවා මුර වෙනස් කිරීමෙන් ද, මෙම අර්බුදයට අවස්ථාවෝචිතව මුහුණ දුන්හ.

**රාජ්‍ය අංශයේ කර්මාන්ත**

1980 දී රාජ්‍ය අංශයේ ව්‍යවසායයන්හි මුළු කාර්මික නිමැවුම 1·16 සංඛ්‍යා සටහනේ දැක්වෙන පරිදි සියයට 6 කින් වැඩි විය. දුව හා දුව නිෂ්පාදිත සියයට 64 කින් ද, රසායන ද්‍රව්‍ය හා ඛනිජ තෙල් නිෂ්පාදිත සියයට 29 කින් ද, මූලික ලෝහ නිෂ්පාදිත සියයට 8 කින් ද, සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 7 කින් ද වැඩි විය. අනෙක් අතට, රෙදිපිළි නිෂ්පාදිත සියයට 24 කින් ද, ආහාර පාන සියයට 8 කින් ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 5 කින් ද, කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට 1 කින් ද පහත වැටින.

**1 · 16 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්තවල නිමැවුම් දර්ශකය (අ)**
**(1977 = 100)**

| කාර්මික ගණය | 1978 | 1979 | 1980 (ආ) |
|---|---|---|---|
| 1. ආහාරපාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 104 | 95 | 87 |
| 2. රෙදිපිළි, ඇඳුම්පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 114 | 111 | 84 |
| 3. දුව හා දුව නිෂ්පාදිත .. | 78 | 96 | 158 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 90 | 131 | 130 |
| 5. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 103 | 97 | 125 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 144 | 157 | 150 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 145 | 176 | 190 |
| 8. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 119 | 107 | 115 |
| සියළු කාර්මික ගණ .. | 108 | 111 | 118 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.


(අ) රාජ්‍ය අංශයේ කර්මාන්ත වැඩි ගණනක් ඇතුළත් කිරීමෙන් මේ දර්ශකය සංශෝධනය කරන ලදී.

(ආ) තාවකාලික.

රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවල මුළු අපනයන ඉපැයුම් 1979 දී රුපියල් දශ ලක්ෂ 2,012 (විගැහි දශ ලක්ෂ 100) සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 3,239 (විගැහි දශ ලක්ෂ 154) දක්වා විගැහි අනුපාතික අනුව සියයට 54 කින් වැඩි විය. ඛනිජ තෙල් අපනයන ඉපැයුම් සියයට 56 කින් වැඩි වීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන පරිමාවේ වැඩිවීම හා මිළ ගණන් ඉහළ යෑම හේතුකොටගෙන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉපැයුම් වර්ධනය විය.

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය

1977 = 100




ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

## 1 · 17 සංඛ්‍යා සටහන

### කාර්මික ව්‍යවසායයන්ට කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1978 – 1980*

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසාය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980* | 1978 | 1979 | 1980* | 1978 | 1979 | 1980* |
| ජාතික කිරි මණ්ඩලය .. | — | 12·8 | 16·2 | 82·7 | 54·0 | 53·0 | 82·7 | 66·8 | 69·2 |
| ලංකා තෙල් සහ මේද .. | — | — | 25·3 | 16·4 | 27·0 | — | 16·4 | 27·0 | 25·3 |
| ශ්‍රී ලංකා සීනි .. | — | 4·5 | 81·8 | — | — | — | — | 4·5 | 81·8 |
| ජාතික පේෂකර්ම .. | 4·2 | 10·9 | 13·6 | — | 13·4 | — | 4·2 | 24·3 | 13·6 |
| ලංකා තුනී ලෑලි .. | 0·3 | — | — | — | — | — | 0·3 | — | — |
| රාජ්‍ය දැව .. | 1·8 | — | — | — | — | — | 1·8 | — | — |
| ජාතික කඩදාසි .. | 33·7 | — | 78·0 | 10·5 | — | 28·7 | 44·2 | — | 106·7 |
| පරන්තන් රසායන .. | 0·7 | — | — | — | — | — | 0·7 | — | — |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ .. | 0·5 | 10·6 | 1·2 | — | — | — | 0·5 | 10·6 | 1·2 |
| රාජ්‍ය පොහොර .. | 1,061·4 | — | 624·1 | — | — | — | 1,061·4 | — | 624·1 |
| ලංකා ඛණිජ තෙල් .. | 8·2 | — | 10·7 | 528·0 | 87·0 | — | 536·2 | 87·0 | 10·7 |
| රාජ්‍ය රබර් නිෂ්පාදන .. | 4·6 | — | — | 0·6 | 0·2 | — | 5·2 | 0·2 | — |
| ලංකා සිමෙන්ති .. | 28·1 | — | 16·0 | — | — | — | 28·1 | — | 16·0 |
| ලංකා ඛනිජ වැලි .. | 23·7 | — | 4·5 | — | — | — | 23·7 | — | 4·5 |
| රාජ්‍ය පතල් කැනීම් හා ඛණිජ සංවර්ධන .. | — | — | 1·9 | — | — | — | — | — | 1·9 |
| ලංකා වානේ .. | 67·5 | — | 10·7 | — | — | — | 67·5 | — | 10·7 |
| රාජ්‍ය ලෝහ භාණ්ඩ .. | — | — | 2·0 | — | 28·6 | — | — | 28·6 | 2·0 |
| එකතුව .. | 1,234·7 | 38·8 | 886·0 | 638·2 | 210·2 | 81·7 | 1,872·9 | 249·0 | 967·7 |

* සංශෝධිත ඇස්තමේන්තු

මූලය: මහා භාණ්ඩාගාරය

ගත වූ වර්ෂය තුළ කාර්මික ව්‍යවසායයන් සඳහා වූ රජයේ වර්තන සංක්‍රාම ගෙවීම් වල සැළකිය යුතු අන්දමේ පහත වැටීම කැපී පෙනෙන ලක්ෂණයක් විය. රාජ්‍ය කාර්මික ව්‍යවසායයන් වාණිජමය ලාභදායිත්වය මත පදනම් වූ ව්‍යවසායයන් වශයෙන් පවත්වාගෙන යාමේ රජයේ ප්‍රතිපත්තිය අනුව යමින් මෙම සංවිධාන අයවැයෙන් කළ වෙන් කිරීම් ඇතුළත ක්‍රියා කිරීමට උත්සාහ කළහ. දැඩි මූල්‍ය පිළිවෙතක් පිළි පැදීම සහ ව්‍යවසායයන් කිහිපයක ක්‍රියාකාරිත්වය යහපත් වීම නිසා වර්තන වියදම් කටයුතු සඳහා වූ රාජ්‍ය සංක්‍රාමයන් 1979 දී රුපියල් දශ ලක්ෂ 210 සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 82 දක්වා අඩු කිරීමට හැකි විය. කෙසේ වෙතත්, ප්‍රාග්ධන සංක්‍රාම සැළකිය යුතු ලෙස වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු සංක්‍රාම 1979 දී රුපියල් දශ ලක්ෂ 249 සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 968 දක්වා වැඩි විය. මුළු ප්‍රාග්ධන සංක්‍රාම ප්‍රමාණය 1979 දී රුපියල් දශ ලක්ෂ 39 සිට 1980 දී රුපියල් දශ ලක්ෂ 886 දක්වා වැඩි විය. ප්‍රාග්ධන සංක්‍රාමයන් සැළකිය යුතු ප්‍රමාණයක් ප්‍රදානය වූයේ රාජ්‍ය පොහොර නිෂ්පාදන (යූරියා කම්හල), ජාතික කඩදාසි (ඇඹිලිපිටිය කඩදාසි කම්හල), සහ සීනි (සෙවනගල සීනි ව්‍යාපෘතිය) යන සංස්ථා සඳහාය. 1.17 සංඛ්‍යා සටහනේ මේ පිළිබඳ තොරතුරු සාරාංශ කොට ඇත. රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් නව ව්‍යාපෘති සඳහා තමන් සතු ප්‍රාග්ධන සම්පත් භාවිතා කිරීමට බලාපොරොත්තු වන නිසා, ඔවුන්ගේ ප්‍රාග්ධන සංක්‍රාම අවශ්‍යතා අනාගතයේදී අඩුවීමට ඉඩ ඇත.

### ආයෝජන ප්‍රවර්ධන කලාපය

වර්තමාන රජයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන්ගෙන් එකක් වන මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) මගින් 1980 වර්ෂය අවසාන වනවිට අනුමත කරන ලද යෝජනා ක්‍රම ගණන 137 කි. මෙවායින් ආයතන 64 ක් විවිධ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ම.කො.ආ.කො. සමග ගිවිසුම් අත්සන් කොට තිබීන. මෙවායින් ආයතන 23 ක් මෙම වර්ෂය අවසාන වන විට කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ආ.ප්‍ර.ක.) තුළ තම වාණිජමය නිෂ්පාදන කටයුතු ආරම්භ කොට තිබූ අතර එයින් බොහොමයක් මසා නිම කළ ඇඳුම් කර්මාන්තයේ යෙදී සිටි ඒවාය. මීට අමතරව, තවත් ආයතන 5 ක නිෂ්පාදිත අත්හද

බැලීම් තත්ත්වයේ තිබිත. ආ. ප්‍ර. ක. තුළ පිහිටි කර්මාන්ත ශාලාවල පුද්ගලයින් 10,581 දෙනෙකුට රැකියා ලබා දී ඇත. 1980 දී ආ.ප්‍ර.ක. හි දළ අපනයන ඉපැයීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 505 (විගැහි දශ ලක්ෂ 22) ක් වූ අතර එයින් සියයට 93 ක්ම ලැබී ඇත්තේ මසා නිම කළ ඇඳුම් අපනයනයෙනි. නිෂ්පාදනයන්ගේ ස්වරූපය අනුව වර්ග කරන ලද, විවිධ කර්මාන්තයන්හී සේවා නියුක්තිය හා දළ අපනයන ඉපැයීම් පිළිබඳ සංසන්දනාත්මක දත්ත පහත දැක්වෙන 1·18 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. කොමිසම විසින් මෙම වර්ෂය තුළදී අනුමත කරන ලද ව්‍යාපෘතීන්ට විදුහුත් උපකරණ, විදුලි උපකරණ කොටස්, නැව් බඩු රඳන, යාන්ත්‍රික උපකරණ, ජල සම්පාදන පොම්ප වැනි නව මාදිලියේ කර්මාන්ත අයත් වේ. විදේශීය ආයෝජකයින් ඇද ගැනීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ ආයෝජන සම්මන්ත්‍රණ, ප්‍රචාරක මාධ්‍ය හා සම්මුඛ සාකච්ඡා පුළුල් වශයෙන් යොදු ගනු ලැබීය.

**1 · 18 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය – සේවා නියුක්තිය සහ අපනයන**

| කර්මාන්තය | 1979 | | 1980* | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (රු. ද. ලක්ෂ) | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (රු. ද. ලක්ෂ) |
| 1· මසා නිමකළ ඇඳුම් .. | 5,675 | 145·1 | 9,147 | 470·1 |
| 2· ධීවර ආම්පන්න . | 73 | 5·1 | 245 | 10·6 |
| 3· රබර් නූල් .. | 26 | 1·2 | 82 | 12·1 |
| 4· මැණික් කැපීම .. | 110 | 0·7 | 285 | 3·2 |
| 5· තේ පැකට් කිරීම .. | — | — | 12 | 3·8 |
| 6· කජු නිෂ්පාදන .. | — | — | 483 | 4·8 |
| 7· අනෙකුත් .. | — | — | 327 | 0·7 |
| එකතුව .. | 5,884 | 152·1 | 10,581 | 505·3 |

* තාවකාලික. මූලය: මහ කොළඹ ආර්ථික කොමිෂම.

## ආර්ථික හා සමාජ සේවා

රාජ්‍ය හා පෞද්ගලික අංශවල විවිධ ආර්ථික ක්‍රියාකාරිත්වයෙන් උද්ගත වූ පුළුල් හා තීව්‍ර ඉල්ලුම සපුරාලීම සඳහා දරූ නිරන්තර ප්‍රයත්නයක් ලෙස 1980 වර්ෂයේ ආර්ථික හා සමාජ සේවා මෙන්ම පසුතල පහසුකම් අංශයන්හි ද දක්නා ලද උපනතීන් සාරාංශ කළ හැකිය. 1977 අග භාගයේදී හඳුන්වා දුන් නව ආර්ථික ප්‍රතිපත්තිවලින් හටගත් ආර්ථික පුනර්ජීවනය ඔස්සේ සීඝ්‍රයෙන් වර්ධනය වූ නිෂ්පාදන අංශයනට සරිලන අන්දමේ වේගයකින්, ගමනා ගමන පණිවුඩ හුවමාරු සහ බල ශක්තිය වැනි පසුතල පිරිවැය අංශයන් ද වර්ධනය වීම අවශ්‍ය විය. බල ශක්තිය, ගමනා ගමනය සහ පණිවුඩ හුවමාරු සේවා වැනි අංශයන්හි සංවර්ධනය සඳහා විශාල පරිමාණ සැළසුම් කිරීමට සහ ක්‍රියාවට නැංවීමට දීර්ඝ කාලයක් අවශ්‍ය වන බැවින්, පසුගිය අවුරුදු තුනක කාලසීමාවේ දී ශ්‍රී ලංකාවේ දී පැහැදිලිව පෙනී ගිය පරිදි, එවැනි පසුතල පහසුකම් සඳහා සීඝ්‍රයෙන් වර්ධනය වන ඉල්ලුම විසින් ඒවායේ සැපයුම කෙටිකාලීනව හා මැදි කාලීනව ඉතා පහසුවෙන් අභිබවා යනු ලබන බව කිව හැකි ය. තව ද, සාමාන්‍යයෙන් ආර්ථික හා සමාජයීය සේවා අංශයන්හි කෙරෙන ආයෝජනයන්ගෙන් සෘජු ආර්ථික නිමැයුමක් උත්පාදනය නොවන බැවින්, නිෂ්පාදනය මූලික කර ගත් ව්‍යාපාර හා පසුතල පිරිවැය යෝජනා ක්‍රම අතර ආයෝජන බෙදා හැරීමේදී මනා තුලනයක් ඇති කරලීමට ද උත්සාහ දැරිය යුතුය.